

## දුවක ලද මා මවකි නිවුණු

තුෂාරි ප්‍රියංගිකා

ඈත ඇති ලා ළදළු මත්තේ
පින්න ඉහිරුණු කුසුම් ඉත්තේ
රැයේ සඳ දිය උදා හිරු රැස
උණුහුමෙන් හදවත ම ගැස්සේ

හීනි දෙතොලග හිනා වැස්සේ
හීන ඇති හෙවනක පියස්සේ
ළමැද්දේ හිස හොවා සිත් සේ
වැතිරියන් ඇහිපියන් අස්සේ

අකුරු ඇහිදින පොළොව අතුරා
පොකුරු වගෙ මල් සුවඳ පතුරා
සුතුරු සේ ඇති ස්නේහෙ මතුරා
ඉසුරු තෙත හදවතය උතුරා

තුරුවියන් යට නිවහනක් ඇති
මඳපවන් සිත නිවනවා ඇති
රන්රුවන් සේ ආදරය ඇති
ඉගිලියන් ආකහේ ඉඩ ඇති

පියවරෙන් පියවරම තබනු
පියගැටේ පා ලකුණු බලනු
පියා දෑසග සිනා කඳුළු
දුවක ලද මා මවකි නිවුණු

## පුතුගේ වෙනස් වීම

දයා මානෙල් සෙනෙවිරත්න

දුරැතු මහේ විසිතුන්වෙනිදාවක ලෝකෙම රැජිනිය ලැබුන   කියා
අපගේ නුවණැති පුතා රැවටුනා කිසි කෙනෙකුන්වත් නොසිතු   නිසා
ඉවසුම් දෙනු බැහැ අම්මට මේ ගැන පුතා රැවටුනේ ඇයිද   කියා
දිවා රැයේ නිදි නැතිව හඬනවා මේ ලෙස සිදු වුනෙ ඇයිද   කියා

අහසයි පොළවයි වගේනෙ දෙන්නා ගැලපෙන්නේ නැහැ කිසි   අතකින්
වශී ගුරුකමින් අල්ලා ගත්තා කෙල්ලගෙ පැත්තෙ අය කපටි   කමින්
මවට ආදරෙන් සිටි මගෙ දරුවා කතා බහක් නැහැ මව   සමගින්
එකමුතු වී සිටි සහෝදරයො ටික වෛර කෙරෙව්වා සහැසි   සිතින්

පෙෂර් ෂුගර් එකිනෙකට වැඩිවෙලා අම්මා හඬනවා හිඳි   නොබලා
ඇසත් ලෙඩවෙලා හොඳටම දුබලයි තවමත් තැවෙනවා දුක   දැනිලා
මැණිකක් වගේ රැකි පුතා වෙනස් වුනෙ ඇයිද දෙවියන් මේ ලෙස   කියලා
දෑසේ කඳුලු නැහැ හඬනට දැන් නම් ඉන්නෙද කෙලෙසින් දුක   නසලා

දහමට අනුවයි හැම සිදුවනුයේ කුමකට හඬම්ද දුකය   කියා
හැමකට පොදු වූ ධර්මතාවයෙන් දැන්වත් ඉවසා සිටිම්   කියා
මවහට ආදරයක් පුතු නැතිකොට කුමටද පල නැත හැඬුව   කියා
දහමට අනුවම සැනසෙන්නෙමි මම කිසිවක් තිර බව නැතෙයි   කියා

## නුඹට

කාංචනා ප්‍රියකාන්ත

ලා රෝස මල් පොකුරු විලි බරව බිම බලන
සුවඳ සුළඟක එතී නිහඬ ගීයක් ගයන
මාවතකි අප දිහා පුදුමයෙන් මෙන් බලන
කොහේ ගියෙදැයි කියා අසනවා අප දෙදෙන

ආදරේ පුරවාපු තරු ඇහිඳගත් අහස
ඉඳ හිටලා ගැනපු තරු පොළවටම විසි කෙරුව
බිම වැටුණු තරු ඇහිඳගෙන ගෙදර ගෙනියන්න
එන්නේ නැද්දැයි කියා අහනවා අප දෙදෙන

නම නොදන්නා මහා ගස් වලින් සෙවන වුණ
තාර පාරක ඈත කොනක ඇති අවන්හල
පාලු මේසයක් උඩ කෝපි වීදුරු පිරෙන
නොහඳුන බව කියන්නේ කිමද අප දෙදෙන

ඒ අපම බව හැගෙන තවත් දෙදෙනෙක් සිටින
ඒ අපම දැයි කියා දැන නොදැන මගහැරෙන
එහෙත් පෙර පුරුදු ලෙස පුරුද්දට සිනා සී
අද නතර වී සිටිමු නොහඳුනන ලෙස මෙතැන



## පුතුට

ආර්ය ගමගේ

කැටයක් ඇතුලෙ ඇති රන් කාසිය...... සේම
අගයක් නොමැත පිය මෙහෙවර කල බෝම
වියපත් වුනු දාට ඔහු කොන්....... කෙරුවාම
තනියෙන් වැලපේවි කඳුළැලි......... සගවාම

නුඹගේ පුතුන් තුරුලට ගෙන සිටින .. කල
සිහිවේ නුඹව රැක ගත් හැටි ලෙසින්.. මල
ඔහුගේ දෙනෙත් තුල සැගවුනි කඳුළු. වැල
මතකේ යලිත් පුබුදයි කල නොහැකි.. මිල

පිසිනා අහර සෙවනේ නීති.. නැතුවාට
දැනුනා හඬක් කුස තුල පෙරලෙන රෑට
හඬනා විටදි ඉල්ලා මසවුළු........ පාට
පිරුනා සිතත් ඔහුගේ නුඹ කන... දාට

වැතිරී දිරා ගිය සයනේ පැදුර ........ මත
පැතිරී ගියා සුසුමේ හඬ ...........රෑ දසත
සුවසේ නිදත් නුඹ වැළඳා පියඹ.... ගත
නොතලා සිටින් වියපත් පිය රජුගෙ සිත

පෙම්මා වැඩුව සිත කිසිදා නැත...... බිඳුනේ
ඉන්නා සුර පුරේ ඔහුගේ දුක......... දකිනේ
නිම්මා නොමැති වැසි දිය සේ ඇද හැලුනේ
අම්මා හෙලු කඳුළුයි නුඹගේ......... පුතුනේ

## රළ - වෙරළ හා ගල්පර

රුවන් බන්දුජීව

කොහේදෝ යන ගමන්
කිසියම් සිදුවීමකින් කැළැඹී
එක්වනම හුන් තැනම
නතර වූවා වැන්න මේ කඳු

ගණන් ගන්නේ නැතිව
අම්බරේ ඇද පලුදු
කොයි කොණින් පෑව්වත්
සිනාසෙනවා තරිඳු

ගහකොළට හිමි වර්ණ
සොයා අරගල කළත්
අවර්ණව ඇද වැටෙන
කැරලිකරුවන්ය වැහි බිඳු

පොදු සමාවක් ලැබී
හිරෙන් එළියට ආවොත්
පාඨකයන්ට තද වී
උඹට ගරහයි සිළිඳු

මට හොඳාකාරවම මතකයි
තාත්තා ගෙනත් දුන්
සෙල්ලම් අශ්වයා මළ පසු
උගේ ලී මළකඳ වැළඳගෙන
හැඬූ හැටි ඒ බිළිඳු

රළ - වෙරළ හා ගල්පර
උනුන් හමු නොවේනම්
අපරිමිත සිඳු හදෙත්
සද්දයක් නැත කිසිදු ...

## රාත්‍රිය

එස්. මහින්ද හිමි

සමන් පිච්ච මල් ඉහිරුණු
නිල් තණ කොළ පිට්ටනියක්
වගෙයි අහස අන්න බලනු
කොච්චර ලස්සනද රෑට

බකමූණෝ පියාඹති
අනෙක් කුරුල්ලෝ නිදති
බෝ අතුවල එල්ලීගෙන
මා වවුලෝ කෑ ගසති

මගෙ සුරතල් අක්කාගේ
මාලේ මුතු ඇට වාගේ
මේ වැටෙන්නෙ පිණි බින්දුත්
හදමු එකක් ඒ වාගේ

හඳ හාමී අප දිහාව
එබී බලයි පා හිනාව
සිහිල් සුළං දැල් විදිනට
දොරට යන්ට හොඳ වෙලාව

අහසේ තරු මල් පිරිලා
පොළොවේ සුදු මල් පිපිලා
මගුල් ගෙවල් දෙකක් වගෙයි
මේ දෙපළම හැඩ ගැහිලා